දුරකථන ) 0112669192 , 0112675011
தொலைபேசி ) 0112698507 , 0112694033
Telephone ) 0112675449 , 0112675280

ෆැක්ස් ) 0112693866
பெக்ஸ் ) 0112693869
Fax ) 0112692913

විද්‍යුත් තැපෑල )postmaster@health.gov.lk
மின்னஞ்சல் முகவரி
e-mail )

වෙබ්අඩවිය ) www.health.gov.lk
இணையத்தளம்


මගේ අංකය )
எனது இல )
My No. ) CF/EXC/07/2021

ඔබේ අංකය )
உமது இல )
Your No. : )

දිනය )
திகதி ) 2022/02/ 23
Date )

සුවසිරිපාය
சுவசிரிபாய
**SUWASIRIPAYA**

# සෞඛ්‍ය අමාත්‍යාංශය
# சுகாதார அமைச்சு
# Ministry of Health

---

**පොදු චක්‍රලේඛ ලිපි අංක :-** 02/21/2022

පළාත් සෞඛ්‍ය ලේකම්වරුන්,

නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ශ්‍රී ලංකා ජාතික රෝහල,

පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

රේඛීය අමාත්‍යංශ යටතට ගැනෙන සියළුම රෝහල් අධ්‍යක්ෂවරුන්,

ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරුන්,

අදාල ආයතන ප්‍රධානීන් වෙත.

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ( MT - 06 - 2016 ) වැටුප් පරිමාණයේ පරිපූරක වෛද්‍ය සේවයට අදාල භෞත චිකිත්සක සේවාවේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

භෞත චිකිත්සක සේවාවේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා පළමු ශ්‍රේණියට උසස්වී වසර පහක් (05) ගතවීමට පෙර සමත් වියයුතු කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය දින ඉංග්‍රීසි මාධ්‍යයෙන් පවත්වනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ. විභාගය පවත්වනු ලබන දිනය, ස්ථානය හා වේලාව ප්‍රවේශ පත්‍රයේ සඳහන් කරනු ඇත.

**02. සුදුසුකම් -**

මෙම විභාගයට අයදුම් කළ යුත්තේ භෞත චිකිත්සක සේවාවේ I ශ්‍රේණියට පත්වීම් ලද හා පහත තුන ඡේදය අනුව කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් නොවන නිලධාරීන් පමණි.

**සැ. යු. :- 2021/12/31 දින වනවිට I වන ශ්‍රේණියට පත්කර අදාළ පත්වීම් ලිපිය ලබා ඇති නිලධාරීන්ගේ අයදුම්පත් පමණක් අධ්‍යක්ෂ (විභාග) වෙත එවීමට කටයුතු කරන්න.**

**03. කාර්යක්ෂමතා කඩඉම් විභාගයෙන් නිදහස් කිරීම -**

රා.ප.ච 6/2006 අනුව 2016.09.22 දින රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අනුමත කරනලද නව බඳවාගැනීමේ පරිපාටිය බලාත්මක වන දිනට එනම් 2016.01.01 දිනට I ශ්‍රේණියේ වසර පහක (05) සතුටුදායක සේවාකාලයක් සම්පූර්ණ කර ඇති නිලධාරීන් සඳහා තුන්වන කාර්යක්ෂමතා කඩඉම සමත්වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

**04. අයදුම්පත් -**

මෙම චක්‍රලේඛ ලිපියේ අගට දක්වා ඇති ආකෘතිය අනුව අයදුම්කරු විසින් සකස් කරගත යුතු අයදුම්පත් ආයතන ප්‍රධානියා මගින්, කොළඹ 10, පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත, අංක 385, "සුවසිරිපාය" සෞඛ්‍ය අමාත්‍යාංශයේ, අධ්‍යක්ෂ (විභාග) වෙත **2022/03/31** දින හෝ ඊට පෙර ලැබෙනසේ ලියාපදිංචි තැපැලෙන් එවිය යුතුය. සෑම අයදුම්පතකම දක්වා ඇති තොරතුරු නිවැරදි බව ආයතන ප්‍රධානියා විසින් සහතික කර තිබිය යුතුය. තම අයදුම්පත සමග රාජකාරී ලිපිනය හෝ පෞද්ගලික ලිපිනය ලියන ලද රු.45.00 ක් වටිනා මුද්දර ඇලවූ 9" × 4" ප්‍රමාණයේ ලියුම් කවර 02 ක් ද එවිය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයදුම්පත්ද, අසම්පූර්ණ හෝ වැරදි සහිත වන අයදුම්පත්ද, නැවත දැනුම්දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. අයදුම්කරුගේ සහතිකය

මගේ දැනුම හා විශ්වාසය පරිදි,

(I) මෙම අයදුම්පත්‍රයේ සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවත් මෙම විභාගයට මා පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බැවින් විභාග ගාස්තු ගෙවීම අනවශ්‍ය බවත් / ප්‍රථම වතාවට* නොවන බැවින් රු.....................ක් වටිනා මුද්දර අලවා ඇති බවත්* මෙම අයදුම්පත්‍රයට මා විසින් අලවා ඇති මුද්දර අවලංගු කිරීමට පෙර වලංගු වූ පාවිච්චි නොකරන ලද මුද්දර බවත් ප්‍රකාශ කරමි.

(II) සෞඛ්‍ය අමාත්‍යාංශය විසින් විභාග පිළිබඳව පනවා ඇති නීතිරීති වලට එකඟව ක්‍රියා කිරීමටත්, මෙම විභාගය පිළිබඳ ව්‍යවස්ථාව අනුව මා නුසුදුස්සකු බව පෙනී ගියහොත්, මගේ විභාගපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන කවර හෝ තීරණයකට මම එකඟ වන බවත් මෙයින් සහතික කරමි.

.............................................
අයදුම්කරුගේ අත්සන

දිනය ...........................................

06. පෞද්ගලික ලිපිගොනු භාර විෂය නිළධාරියාගේ සහතිකය

මෙම අයදුම්පත බාර ගන්නා අවසාන දිනයට පෙර මා වෙත බාරදුන් බවත්, පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරුවලට අනුව අයදුම්කරු විසින් නිවැරදිව මෙම අයදුම්පත සම්පූර්ණකර ඇති බවත්, මෙම අයදුම්පතේ පිටපතක් පෞද්ගලික ලිපි ගොනුවට ගොනුකළ බවත් සහතික කරමි.

.......................................
නම සහ අත්සන

දිනය :-...........................................................

07. ආයතන ප්‍රධානියාගේ සහතිකය

.................................................................................... මිය / මෙනෙවිය* ........................................................නිලධාරියෙකු වශයෙන් මෙම ආයතනයේ සේවය කරන බවටත්, මෙම විභාගයට පෙනී සිටින්නේ ප්‍රථම වතාවට බවද / ප්‍රථම වතාවට නොවන* බවද රු............ක් වටිනා මුද්දර මෙම අයදුම්පත්‍රයට අලවා ඇති බවද /මුද්දර ඇලවීමට අනවශ්‍ය බවටද* අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොණුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත් මා ඉදිරිපිටදී අත්සන් කළ බවත් සහතික කරමි.

........................................
ආයතන ප්‍රධානියාගේ අත්සන
(රබර් මුද්‍රාව තැබිය යුතුය)

දිනය :- ....................................

08. විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත ව්‍යාපාර ප්‍රධානියාගේ සහතිකය

.................................................. මහත්මිය / මෙනවිය*, .............................. නිලධාරිණියක වශයෙන් මගේ ආයතනයේ සේවය කරන බවත්, අයදුම්පතේ දී තිබෙන තොරතුරු අයදුම්කරුගේ පෞද්ගලික ලිපිගොනුවේ ඇති තොරතුරු අනුව නිවැරදි බවත්, මෙම විභාගයට පෙනී සිටීමට ඇයට සුදුසුකම් ඇති බවත් සහතික කරමි.

දිනය ..........................

.............................................
විමධ්‍යගත කොට්ඨාශ / විශේෂිත
ව්‍යාපාර ප්‍රධානියාගේ අත්සන

(* අනවශ්‍ය කොටස් කපා හරින්න.)

[රබර් මුද්‍රාව තැබිය යුතුය]

EXC

කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා

ආදර්ශ අයදුම්පත

**සෞඛ්‍ය අමාත්‍යාංශයේ ( MT - 06 - 2016 ) වැටුප් පරිමාණයේ පරිපූරක වෛද්‍ය සේවයට අදාල භෞත චිකිත්සක සේවාවේ I ශ්‍රේණියේ නිලධාරීන් සඳහා වන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය - 2022 (පළමු වාරය)**

01. (අ) I. අයදුම්කරුගේ සම්පූර්ණ නම (සිංහලෙන්) - ..........................................................

II. අයදුම්කරුගේ සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

III. මුලකුරු සමඟ නම (සිංහලෙන්)- ..........................................................

..........................................................

IV. මුලකුරු සමඟ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) -

(ආ) I. I ශ්‍රේණියට උසස්කල දිනය හා ලිපිඅංකය..........................................................

II දැනට ලබන වාර්ෂික වැටුප - ..........................................................

III. ජාතික හැඳුනුම්පත් අංකය -

IV ජංගම දුරකථන අංකය -

V. විද්‍යුත් තැපෑල: ..........................................................

02. (අ) දැනට සේවය කරන ආයතනයේ නම :– සිංහලෙන්..........................................................

ඉංග්‍රීසියෙන්..........................................................

(ආ) මෙම ආයතනය අයත් වන්නේ :– රේඛීය අමාත්‍යාංශයට ☐ පළාත් සභාවට ☐

(ඇ) පළාත් සභාවට නම් අදාල පළාත :– ..........................................................

(ඈ) එය අයත් දිස්ත්‍රික්කය - ..........................................................

(ඉ) විභාග ප්‍රවේශ පත්‍රය එවීම සඳහා නිවැරදිව හා පැහැදිලිව ලිපිනය ලියන ලද 9"×4" ප්‍රමාණයේ රු 45.00 ක මුද්දර ඇලවූ ලියුම් කවර 02 ක් අයදුම්පත්‍රයට අමුණා ලද්දේද ? ..........................................................

(ඊ ) 1. තැපැල් ලිපිනය (සිංහලෙන්) - ..........................................................

..........................................................

2. තැපැල් ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරින්) - ..........................................................

..........................................................

03. විභාගයට පෙනී සිටින මාධ්‍යය - (සිංහල/දෙමළ/ඉංග්‍රීසි) - ..........................................................

04. (අ) මීට ප්‍රථම මෙම විභාගයට පෙනී සිටියේද? ..........................................................

(ආ) අයදුම්පත් ඉදිරිපත් කරන්නේ ප්‍රථම වතාවට නොවේනම් මුද්දර අලවා තිබේද? ..........................................................

මුද්දර කොටුව

උත්තර පත්‍රය දෙස බැලීමද නොකළ යුතුය. එසේම වෙනත් අයදුම්කරුවෙකුට උදව් කිරීමෙන් හෝ වෙනත් අයදුම්කරුවකුගෙන් හෝ පුද්ගලයකුගෙන් උදව් ලබාගැනීමෙන්ද වැළකී සිටිය යුතුය. තවද ජංගම දුරකථන හා ඒ හා සමාන සන්නිවේදන හා විද්‍යුත් උපකරණද භාවිතා කිරීමෙන් වැළකී සිටිය යුතුය. මෙම නීති කඩ කරනු ලබන ඕනෑම අපේක්ෂකයෙකු දඬුවම් ලැබීමට යටත් වනු ඇත.

**10.** **කරුණාකර මෙම චක්‍රලේඛ ලිපියේ අඩංගු දෑ ඔබ ආයතනයේ සේවයේ නියුතු I ශ්‍රේණියේ භෞත චිකිත්සක සේවාවේ නිලධාරීන්ගේ දැනගැනීමට සලස්වන්න. මෙම තොරතුරු <u>www.health.gov.lk</u> වෙබ් අඩවියේද ඇතුලත් කර ඇත.**

**ස.යු. - මෙම චක්‍රලේඛ ලිපියේ සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි නිවේදනයන්හි පාඨ අතර යම් අනනුකූලතාවයක් මතුවුවහොත් සිංහල මාධ්‍ය විභාග නිවේදනය බලපැවැත් වේ.**

Hamoy

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
ලේකම් වෙනුවට
සෞඛ්‍ය අමාත්‍යාංශය

චාමික එච්. ගමගේ
නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (පාලන) II
සෞඛ්‍ය අමාත්‍යාංශය
"සුවසිරිපාය"
කොළඹ 10.

සැ.යු. :- ආදර්ශ අයදුම්පතෙහි ආකෘතියට අනුවල අයදුම්පත්‍රය $A_4$ කඩදාසියක පළමු පිටුවේ අංක 01 සිට 04 දක්වාත් දෙවන පිටුවේ අංක 05 සිට 08 දක්වාත් සකස් කළ යුතුය. ඉහත ආකෘතියට අනුකූල නොවන සියළුම අයදුම්පත්‍ර නැවත දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ.

05. විභාග ගාස්තු

I. විභාගයට පළමු වන වතාවට ඉදිරිපත් වන අයදුම්කරුවන් විභාග ගාස්තු වලින් නිදහස් කරනු ලැබේ. අනෙකුත් අයදුම්කරුවන් එක් විෂයකට රු. 25/= බැගින් අවලංගු නොකල මුද්දර අයදුම්පත්‍රයේ අලවා තමන්ගේ අත්සන හා දිනය යොදා අවලංගු කළයුතුය.

II. කිසිදු කරුණක් මත මෙසේ ගෙවන ලද විභාග ගාස්තු වෙනත් විභාගයක් සඳහා මාරු කිරීමක් හෝ ආපසු ගෙවීමක් සිදු කරනු නොලැබේ.

06. විභාගයට ඇතුලත් කර ගැනිම.

I. පිළිගත් අයදුම්පත් සඳහා අපේක්ෂකයන්ට ප්‍රවේශපත් නිකුත් කරනු ලැබේ. එම ප්‍රවේශපත් නියමිත පරිදි සම්පූර්ණ කර විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළයුතුය. එසේ නොමැතිව විභාගයට පෙනී සිටීමට ඉඩදෙනු නොලැබේ.

II. විභාග අපේක්ෂක/අපේක්ෂිකාවන් විසින් විභාග ශාලාව තුලදී විභාග ශාලාධිපතිට ස්වකීය අනන්‍යතාවය තහවුරු කල යුතුය. ඒ සඳහා පහත දැක්වෙන ලියකියවිලි අතුරින් එකක් ඉදිරිපත් කළයුතුය.

(අ) ජාතික හැඳුනුම්පත

(ආ) සෞඛ්‍ය අමාත්‍යාංශය හෝ ඊට අදාල ආයතනයක් මගින් විධිමත් ලෙස නිකුත් කරන ලද හැඳුනුම්පත්‍රය

(ඇ) වලංගු රියදුරු බලපත්‍රය

(ඈ) වලංගු විදේශ ගමන් බලපත්‍රය

07. විභාග පටිපාටිය

මෙම විභාගය තනතුරට අදාල විෂයය දැනුම සම්බන්ධ ව්‍යුහගත රචනා මාදිළියේ ප්‍රශ්න පත්‍රයකින් සමන්විතවේ. එම ප්‍රශ්න පත්‍රය ප්‍රශ්න අටකින් (08) යුක්ත වන අතර එයින් ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සැපයිය යුතුවේ. කාලය පැය (03) තුනකි. මුළු ලකුණු 100 කි. සමත්වීම සඳහා අවම වශයෙන් ලකුණු 40 ක් ලබාගත යුතුය.

08. විෂය නිර්දේශය

විෂයදැනුම ප්‍රශ්න පත්‍රය

(අ) 01. රූමැටියා රෝග
02. හෘද උරස් රෝග
03. ස්නායු රෝග
04. විකලාංග රෝග
05. ළමා රෝග
06. ප්‍රසව භූ නාරි රෝග
07. පිලිස්සුම් අනතුරු
08. ක්‍රීඩා අනතුරු

(ආ) භෞත චිකිත්සක අංශයක් හෝ ඒකකයක් සංවිධානය කිරීම

(ඇ) බඩු ලැයිස්තුවක් නඩත්තු කිරීම

(ඈ) බඩු ඇණවුම් කිරීම

(ඉ) උපකරණ නඩත්තුව හා අලුත්වැඩියා කිරීම

(ඊ) ප්‍රජාපාදිත හා ආයතනික පුනරුත්ථාපන කටයුතු

09. විභාග සම්බන්ධ රෙගුලාසි අනුගමනය කිරීම

අපේක්ෂකයින් විසින් වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ කුමන හෝ පොතකින්, හෝ කවර ආකාරයක සටහන් සහිත කොලයකින්, හෝ වෙනත් කිසිවකින් හෝ ගෙන බලා උත්තර ලිවීම තහනම්ය. වෙනත් අපේක්ෂකයෙකුගේ